# දළ ජාතික නිෂ්පාදිතය, ආදයම සහ වියදම

**සමස්ත උපනතීන්**

1986 දී, ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද. දේ. නි.) සියයට 4.3 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 1985 වර්ධන අනුපාතිකය වූ සියයට 5 හා සසඳන කල මෙම අඩුවීමට විශාල වශයෙන් හේතු වූයේ තේ හා වී උප අංශවල නිෂ්පාදනය අඩුවීමය. එසේ වුවද, පොල්, සුළු අපනයන භෝග හා අතිරේක ආහාර භෝග උප අංශවල සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරේ. නිමැවුම් කර්මාන්ත අංශයේ, නිෂ්පාදන කර්මාන්ත හා කුඩා සහ අනෙකුත් කර්මාන්තවල සැළකිය යුතු වර්ධනයක් වාර්තා විය.

පවත්නා සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි.) 1986 දී රුපියල් දශ ලක්ෂ 159,900 වූ අතර, එය පසුගිය වසරට වඩා සියයට 10.3 ක වැඩිවීමකි. ද. ජා. නි. මූර්ත වැඩිවීම සියයට 4.5 ක් වූ අතර, 1985 දී එය 5.3 ක් විය. සමස්ථ මිළ වෙනස්වීමේ මිණුමක් වන ආරෝපිත ද. ජා. නි. ගැලපුම 1986 දී සියයට 5.5 කින් ඉහළ ගිය අතර, එය 1985 දී වැඩිවූයේ සියයට 1 කිනි.

1986 දී ශ්‍රී ලංකාවේ මැදි වසර ජනගහණය දශ ලක්ෂ 16.1 ක් වශයෙන් තාවකාලික ලෙස ඇස්තමේන්තුකර ඇති අතර, එය 1985 ට වඩා සියයට 1.8 වර්ධනයකි. ඒ අනුව ඒක පුද්ගල ද. ජා. නි. පවත්නා මිළ අනුව රු. 9,918 (ඇ. එ. ජ. ඩොලර් 354) ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. පසුගිය වර්ෂයෙහි ඒක පුද්ගල මූර්ත ආදායමේ වර්ධනය වූ සියයට 3.7 හා සසඳන විට මෙම වර්ෂයෙහි වැඩිවීම සියයට 2.7 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. වෙළෙඳ අනුපාතයෙහිවූ බලපෑම් හා ගැලපීමෙන් පසුව ඇස්තමේන්තු කරන ලද මූර්ත ජාතික ආදයම සියයට 3.4 කින් 1986 දී වැඩිවී ඇත.

1986 වර්ෂයේදී ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන් දයක වූ අංශ වශයෙන් නිමැවුම් කර්මාන්ත, කෘෂිකර්මය, වෙළෙඳාම සහ රාජ්‍ය පරිපාලන යන අංශ ගිනිය හැක. ඉන් නිෂ්පාදන කර්මාන්ත අංශය, වර්ධනය අතින් මූලික විය.

**ආංශීය ක්‍රියාකාරිත්වය**

1984-1986 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා විවිධ අංශවල වර්ධන අනුපාතයන් 1.2 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. පසුගිය වර්ෂයට වඩා 1986 දී සියයට 2.6 ක වර්ධනයක් කෘෂිකාර්මික, වන හා ධීවර අංශයේ ඇති විය. කෘෂිකාර්මික අංශයේ එකතුවූ අගයෙහි වැඩිවීම 1986 දී සියයට 2.2 ක්වූ අතර, වන හා ධීවර උප අංශවල වැඩිවීම පිළිවෙලින් සියයට 1.8 ක් හා 8.9 ක් විය. 1985 වර්ෂයේදී කෘෂිකාර්මික අංශයේ පෙන්නුම් කළ සියයට 9.9 ක වර්ධනයට සාපේක්ෂව, 1986 දී පෙන්නුම් කළ දුර්වල ක්‍රියාකාරිත්වය, ධීවර උප අංශයේ සිදුවූ සතුටුදයක ක්‍රියාකාරිත්වය මගින් තරමක් දුරට සමහන් කිරීමට සමත් විය.

වැවිලි කර්මාන්ත අංශයේ රබර් නිෂ්පාදනය සියයට 0.6 කින් වැඩිවූ අතර, තේ නිෂ්පාදනය සියයට 1.3 කින් පහත වැටිණි. 1985 දී පොල් උප අංශයේ වර්ධනය සියයට 52 ක් ලෙස වාර්තා වූ අතර, 1986 දී එය ආන්තික වශයෙන් සියයට 2.8 ක වර්ධනයක් පෙන්විය. ධීවර උප අංශයේ මුහුදු මාළු නිෂ්පාදනය සියයට 8.3 කින්ද මිරිදිය මාළු නිෂ්පාදනය සියයට 9.8 කින්ද වැඩිවිය.

## 1.6 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශීය සංයුතිය සහ වර්ධනය 1984 – 1986

| | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | ද. ජා. නි. හි ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රු. දශ ලක්ෂ) | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1984(අ) | 1985(අ) | 1986(අ) | 1984 | 1985 | 1986 | 1985 | 1986 | 1985 | 1986 |
| 1. කෘෂිකර්මය, දුව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය .. | 26,113 | 28,366 | 29,106 | 25·8 | 26·6 | 26·1 | 2,253 | 740 | 42·2 | 15·3 |
| 1·1 කෘෂිකර්මය .. | 22,300 | 24,504 | 25,037 | 22·0 | 23·0 | 22·4 | 2,204 | 533 | 41·3 | 11·0 |
| 1·1·1 තේ .. | 2,681 | 2,759 | 2,723 | 2·6 | 2·6 | 2·4 | 78 | – 36 | 1.5 | – 0·7 |
| 1·1·2 රබර් .. | 878 | 851 | 856 | 0·9 | 0·8 | 0·8 | – 27 | 5 | – 0·5 | 0·1 |
| 1·1·3 පොල් .. | 2,513 | 3,828 | 3,935 | 2·5 | 3·6 | 3·5 | 1,315 | 107 | 24·6 | 2·2 |
| 1·1·4 වී .. | 6,166 | 6,783 | 6,613 | 6·1 | 6·4 | 5·9 | 617 | – 170 | 11·6 | – 3·5 |
| 1·1·5 අනෙකුත් .. | 10,062 | 10,283 | 10,910 | 9·9 | 9·6 | 9·8 | 221 | 627 | 4·1 | 13·0 |
| 1·2 දුව ආදී වන ද්‍රව්‍ය .. | 1,889 | 1,923 | 1,958 | 1·9 | 1·8 | 1·8 | 34 | 35 | 0·6 | 0·7 |
| 1·3 ධීවර .. | 1,924 | 1,939 | 2,111 | 1·9 | 1·8 | 1·9 | 15 | 172 | 0·3 | 3·6 |
| 2. පතල් හා කැනීම් කටයුතු .. | 2,449 | 2,486 | 2,615 | 2·4 | 2·3 | 2·3 | 37 | 129 | 0·7 | 2·7 |
| 3. නිමැවුම් කර්මාන්ත .. | 15,390 | 16,193 | 17,558 | 15.2 | 15·1 | 15·7 | 803 | 1,365 | 15·1 | 28·3 |
| 3·1 අපනයන සැකසීම .. | 2,983 | 3,222 | 3,225 | 2·9 | 3·0 | 2·9 | 239 | 3 | 4·5 | 0·1 |
| 3·2 නිෂ්පාදන කර්මාන්ත .. | 10,296 | 10,811 | 12,108 | 10·2 | 10·1 | 10·8 | 515 | 1,297 | 9·7 | 26·9 |
| 3·3 කුඩා සහ අනෙකුත් කර්මාන්ත .. | 2,111 | 2,160 | 2,225 | 2·1 | 2·0 | 2·0 | 49 | 65 | 0·9 | 1·3 |
| 4. තැනීම් .. | 8,030 | 8,070 | 8,191 | 7·9 | 7·6 | 7·3 | 40 | 121 | 0·7 | 2·5 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා .. | 1,239 | 1,313 | 1,406 | 1·2 | 1·2 | 1·3 | 74 | 93 | 1·4 | 1·9 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව | 12,437 | 12,959 | 13,377 | 12·3 | 12·1 | 12·0 | 522 | 418 | 9·8 | 8·7 |
| 7. තොග සහ සිල්ලර වෙළඳාම .. | 22,029 | 22,925 | 23,821 | 21·7 | 21.5 | 21·4 | 896 | 896 | 16·8 | 18·6 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපළ .. | 4,526 | 4,975 | 5,174 | 4·5 | 4·7 | 4·6 | 449 | 199 | 8·4 | 4·1 |
| 9. නිවාස අයිතිය .. | 3,381 | 3,432 | 3,497 | 3·3 | 3·2 | 3·1 | 51 | 65 | 1·0 | 1·3 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු .. | 4,165 | 4,432 | 5,274 | 4·1 | 4·2 | 4·7 | 267 | 842 | 5·0 | 17·5 |
| 11. සේවා (අන් තැනෙක සඳහන් නොවන) . | 4,636 | 4,419 | 4,242 | 4·6 | 4·2 | 3·8 | – 217 | – 177 | – 4·1 | – 3·7 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය .. | 104,395 | 109,570 | 114,261 | 103·0 | 102·7 | 102·4 | 5,175 | 4,691 | 97·0 | 97·2 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම .. | – 2,996 | – 2,829 | – 2,696 | – 3·0 | – 2·7 | – 2·4 | 159 | 133 | 3·0 | 2·8 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. | 101,399 | 106,741 | 111,565 | 100·0 | 100·0 | 100·0 | 5,334 | 4,824 | 100·0 | 100·0 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 දී නිමැවුම් කර්මාන්ත අංශය සියයට 8.4 කින් වර්ධනය විය. වැවිලි කර්මාන්ත අංශයේ නිපැයුම් වර්ධනය අඩුවීම හේතුකොටගෙන අපනයන කෘෂි සැකසුම් කර්මාන්තයන්හි අඩාලවීමක් දක්නට ලැබිණි. නිෂ්පාදන කර්මාන්ත උපඅංශයේ, රාජ්‍ය අංශයේ කර්මාන්තවල සියයට 7.6 වර්ධනයක්ද, පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය සියයට 15 ක වර්ධනයක්ද පෙන්වීය. කුඩා හා මධ්‍යම කර්මාන්තවල සාපේක්ෂ ඉහළ වර්ධනයක් වාර්තා වී ඇත. රන් ආභරණ නිෂ්පාදනය හා මැණික් හා දියමන්ති කැපීමේ නිමැවුම් වටිනාකම සැළකිය යුතු ලෙස වැඩිවීමක් වාර්තා කොට ඇත.

1986 දී පතල් හා කැනීම් අංශය සියයට 5.2 ක වර්ධනයක් වාර්තා කොට ඇත. විශේෂ හැර ගැනීම් අයිතිය (වි. හැ. අ.) වටිනාකම අනුව සියයට 15.0 ක වැඩිවීමක් වාර්තා වූ මැණික් අපනයනයේ ප්‍රසාරණය මේ සඳහා වැඩි වශයෙන් බලපා ඇත.

1986 දී තැනීම් අංශය සියයට 1.5 කින් වර්ධනය විය. මෙම අඩු වර්ධනයට විශාල වශයෙන් හේතුවූයේ කඩිනම් මහවැලි යෝජනා ක්‍රමයේ තැනීම් අංශයේ වැඩ අඩුවීමත් මූලික වැඩවලින් සැහෙන කොටසක් නිමවී තිබීමත් නිසාය. බැංකු අංශයේ මූල්‍ය ආධාර ඇතිව විශාල පරිමාණයේ තැනීම් කටයුතු පෞද්ගලික අංශය භාරගන්නා ලදී. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා අංශයේ එකතු වූ අගය 1986 දී සියයට 7.1 කින් වැඩිවිය. 1986 දී විදුලි උත්පාදනය සියයට 8.3 කින් වර්ධනය වූ අතර, ගෑස් නිෂ්පාදනය සියයට 35 කින් වැඩිවිය.

ප්‍රවාහනය, ගබඩා කිරීම් සහ පණිවුඩ හුවමාරු අංශය 1986 දී සියයට 3.2 ක වර්ධනයක් දැක්වීය. තොග හා සිල්ලර වෙළඳාම් අංශයේ එකතුවූ අගය සියයට 4 කින් වැඩිවිය. බැංකු කටයුතු, රක්ෂණය හා නිශ්චල දේපල අංශයේ වැඩිවීම පසුගිය වසරේ සියයට 9.9 ක්වූ අතර, මේ වසරේ එය සියයට 4 ක් විය.

1986 දී නිවාස අයිතිය අංශයේ එකතු වූ අගය සියයට 1.9 කින්ද, රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක අංශයේ එකතුවූ අගය සියයට 19 කින්ද වැඩිවිය. සංචාරක කර්මාන්තයේ තියුණු වැටීම තවදුරටත් පැවතීම නිසා සේවා අංශය සියයට 4 කින් අඩුවිය.

**වියදම් රටාව**

1986 දී සියයට 10.2 ක වැඩිවීමක් දක්වමින් පවත්නා වෙළෙඳ මිළ අනුව දළ දේශීය වියදම රුපියල් දශ ලක්ෂ 200,300 ක මට්ටමකට ළඟා විය. පෙර වසරට වඩා සියයට 10.3 කින් වැඩි වූ පරිභෝජන වියදම රුපියල් දශ ලක්ෂ 157,900 ක් විය. පෞද්ගලික පරිභෝජන වියදම සියයට 10.2 කින්ද, රජයේ පරිභෝජන වියදම සියයට 11.3 කින්ද වැඩිවී ඇත.

තොග වෙනස්වීම්ද ඇතුලත්වන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ද. දේ. ප්‍රා. ස.) 1985 දී, සියයට 2.6 කින් අඩු වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පෙන්නුම් කරමින් 1986 දී සියයට 9.8 කින් වැඩිවී ඇත. පෞද්ගලික අංශය හා රාජ්‍ය සංස්ථාද ඇතුළු, ප්‍රාග්ධන සම්පාදනය 1986 දී සියයට 6.4 කින් ඉහළ ගිය අතර, පෙර වර්ෂයේ සියයට 5.5 කින් අඩුවිය. 1985 දී සියයට 11.0 ක වැඩිවීම හා සසඳන විට 1986 දී රාජ්‍ය අංශයේ දළ ප්‍රාග්ධන සම්පාදනය සියයට 23.0 දක්වා වර්ධනය විය.

**1.7 සංඛ්‍යා සටහන**

**ප්‍රාග්ධන වියදමෙහි ආනයනිත ප්‍රමාණය**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1984 | 1985 | 1986 |
|---|---|---|---|
| 1. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 39,558 | 38,457 | 42,326 |
| 2. ආනයනිත ආයෝජන භාණ්ඩ (මි.ර.ගැ. වටිනාකම) .. | 11,443 | 9,488 | 9,649 |
| 3. නැව් සහ ගුවන් යානා හැර ආනයනිත ආයෝජන භාණ්ඩ .. (මි.ර.ගැ. වටිනාකම) | 10,512 | 7,877 | 9,649 |
| 4. ආනයනිත ප්‍රමාණය (අංක 2, අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 28·9 | 24·7 | 22·8 |

මූලය : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1985 දී සියයට 2.8 ක අඩුවීමක් වාර්තා කළ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1986 දී සියයට 10.1 ක් දක්වා ඉහළ ගොස් ඇත. ආනයනිත ආයෝජන භාණ්ඩවල මුළු වටිනාකම 1986 දී සියයට 1.7 කින් වැඩි වූ අතර, 1985 හා සැසඳීමේදී සියයට 17.1 කින් අඩුවී ඇත. ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයනිත ප්‍රමාණය 1986 දී සියයට 22.8 ක් විය.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙන්, සියයට 77.4 ක් පෞද්ගලික අංශය හා රාජ්‍ය සංස්ථා හා සම්බන්ධිතය. ප්‍රාග්ධන සම්පාදනයේ විශාලතම දයකවීම සිදුවූයේ ගොඩනැගිලි සහ අනෙකුත් ඉදිකිරීම් කටයුතු තුළින්ය.

1986 දී යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ හා අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩයන්හි වූ ප්‍රාග්ධන සම්පාදනය වැඩිවූ අතර, ප්‍රවාහණ උපකරණ සඳහා වූ ප්‍රාග්ධන සම්පාදනය අඩුවිය. ඉඩම් සංවර්ධනය හා නැවත වගා කිරීම සියයට 73.2 කින් වැඩි විය.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි පැවැති මුළු සම්පත් ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 179,500 ක් (සියයට 74 ක්) දේශීය මූලයන්ගෙන්ද රුපියල් දශ ලක්ෂ 63,400 ක් (සියයට 26 ක්) ආනයන මගින්ද ලබාගෙන ඇත.

මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 65 ක ප්‍රමාණයක් පරිභෝජනය සඳහා වැය වී ඇත. සියයට 17.5 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා උපයෝගී කරගෙන ඇති අතර, සියයට 17.5 අපනයන භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා වැයවී ඇත. 1985 වසරේ දී වැය වූ ප්‍රමාණයන් හා සසඳන විට සියයට 64 ක් පරිභෝජනය සඳහා ද, සියයට 17.2 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද සියයට 18.9 ක් අපනයන භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා ද වැයවී ඇත.

1978 ස්ථාවර මිළ අනුව ගණනය කරන ලද මුළු සම්පත් ප්‍රමාණය, 1985 දී සියයට 1.5 කින් වැඩි වූ අතර, 1986 දී වැඩි වූයේ සියයට 5.7 කිනි. ආනයනිත භාණ්ඩ හා සාධක නොවන සේවා පසුගිය වර්ෂයේදී සියයට 6.4 කින් අඩුවූ අතර, 1986 දී සියයට 9.4 කින් ඉහළ ගොස්

## 1.8 සංඛ්‍යා සටහන

### සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1978–1986

| ශීර්ෂය | වර්තන වෙළෙඳ මිල අනුව (රු. දශ ලක්ෂ) | | | | 1978 මිල අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1984(අ) | 1985(අ) | 1986(අ) | 1978 | | 1984(අ) | | 1985(අ) | | 1986(අ) | | 1984 ට වඩා 1985 | 1985 ට වඩා 1986 |
| | | | | | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | | |
| 1. මුළු සම්පත් .. | 59,537 | 207,163 | 224,021 | 242,917 | 59,537 | 100 | 84,508 | 100 | 85,809 | 100 | 90,712 | 100 | 1·5 | 5·7 |
| 1·1 වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 42,665 | 153,746 | 162,375 | 179,510 | 42,665 | 72 | 58,907 | 70 | 61,852 | 72 | 64,512 | 71 | 5·0 | 4·3 |
| 1·2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | 16,872 | 53,417 | 61,646 | 63,407 | 16,872 | 28 | 25,601 | 30 | 23,957 | 28 | 26,200 | 29 | –6·4 | 9·4 |
| 2. උපයෝගීකරණය .. | 59,537 | 207,163 | 224,021 | (ආ) 242,917 | 59,537 | 100 | 84,508 | 100 | 85,809 | 100 | 90,712 | 100 | 1·5 | 5·7 |
| 2·1 පරිභෝජනය .. | 36,148 | 123,170 | 143,102 | 157,886 | 36,148 | 61 | 51,959 | 62 | 53,091 | 62 | 54,259 | 59 | 2·2 | 2·2 |
| 2·2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 8,521 | 39,558 | 38,457 | 42,326 | 8,521 | 14 | 14,449 | 17 | 13,688 | 16 | 14,987 | 17 | –5·3 | 9·5 |
| 2·2·1 රජය .. | (3,077) | (7,075) | (7,767) | (9,634) | (3,077) | (5) | (3,890) | (5) | (3,963) | (5) | (4,426) | (5) | 1·9 | 11·7 |
| 2·2·2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල .. | (2,056) | }(32,483) | (30,690) | (32,692) | (2,056) | (3) | }(10,559) | (12) | (9,725) | (11) | (10,561) | (12) | –7·9 | 8·6 |
| 2·2·3 පෞද්ගලික අංශය .. | (3,388) | | | | (3,388) | (6) | | | | | | | | |
| 2·3 තොග වෙනස්වීම් .. | 33 | 150 | 225 | 137 | 33 | — | 36 | — | 63 | — | 38 | — | — | — |
| 2·4 භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයන .. | 14,835 | 44,285 | 42,237 | 42,568 | 14,835 | 25 | 18,064 | 21 | 18,967 | 22 | 21,428 | 24 | 5·0 | 13·0 |

(අ) තාවකාලිකයි.

(ආ) අවසාන අයවැය තත්ත්වය පිළිබඳ දත්ත ලැබුණුවිට සංශෝධනය වීමට ඉඩ ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ඇත. 1986 දී මුළු පරිභෝජනය සියයට 2.2 කින් වැඩිවූ අතර, එය 1985 දී වැඩිවූයේ සියයට 2.2 කිනි. 1985 දී සියයට 5.3 කින් අඩුවූ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය මෙම වසරේදී සියයට 9.5 කින් වැඩිවිය. පෞද්ගලික අංශයේ හා රාජ්‍ය සංස්ථාවල ප්‍රාග්ධන සම්පාදනය 1986 දී සියයට 8.6 කින් ඉහළ ගිය අතර, 1985 දී සියයට 7.9 කින් පහත වැටිණි.

## 1 . 9 සංඛ්‍යා සටහන
## ජාතික ඉතුරුම් 1984 – 1986 (පවත්නා වෙළෙඳ මිළ අනුව)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1984(අ) | 1985(අ) | 1986(අ) |
|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 153,746 | 162,375 | 179,510 |
| 2. දේශීය ඉතුරුම් .. | 30,576 | 19,273 | 21,624 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදයම .. | -3,401 | -3,400 | -3,861 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් .. | 7,031 | 7,273 | 8,251 |
| 5. ජාතික ඉතුරුම් .. | 34,206 | 23,146 | 26,014 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 1, අංක 2 හි ප්‍රතිශතයක් ලෙස) .. | 19·9 | 11·9 | 12·0 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5, අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 22·2 | 14·3 | 14·5 |

(අ) තාවකාලිකයි. මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 දේශීය ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21,600 ක් වූ අතර, එය 1985 ට වඩා රුපියල් දශ ලක්ෂ 2,300 ක වැඩිවීමකි. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කළ දේශීය ඉතිරි කිරීම් 1986 දී සියයට 12.0 ක් වූ අතර, එය 1985 දී සියයට 11.9 ක් විය. 1986 විදේශීය ශුද්ධ සාධක ආදයම සහ පෞද්ගලික සංක්‍රාමද ඇතුළත් වන මුළු ජාතික ඉතිරි කිරීම් සියයට 12.4 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් ඇස්තමේන්තු ගත වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 26,000 කට ළඟාවී ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ජාතික ඉතිරි කිරීම් 1985 දී සියයට 14.3 ක් වූ අතර, 1986 දී සියයට 14.5 දක්වා ඉහළ ගොස් ඇත.